19/10/2015 2010/03/01 (31)

# ප්‍රසිද්ධ ප්‍රදර්ශන ආඥා පනත

(134 වෙනි පරිච්ඡේදය)

පහත සඳහන් සංශෝධනයන් මෙහි ඇතුළත්ව ඇත

1951කේ අංක 23 දරන පනත

කොළඹ ආණ්ඩුවේ ග්‍රන්ථ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි

මිල : ශත 20යි

තැපැල් ගාස්තුව : ශත 10යි

# ප්‍රසිඞ ප්‍රදශීන ආඥාපනත

## ප්‍රසිඞ ප්‍රදශීන

ප්‍රසිඞ ප්‍රදශීන වඩාත් විධිමත් කිරීම සඳහා විධිවිධාන යෙදීම පිණිස පනවන ලද ආඥා පනතකි

(1912 මැයි මස 24 වැනි ද)

1. මෙම ආඥා පනත ප්‍රසිඞ ප්‍රදශීන ආඥා පනත නමින් හැඳින් විය හැකි ය. ලුහුඬු නාමය

2. මෙම ආඥා පනතේ " ප්‍රසිඞ ප්‍රදශීන " යන පාඨයට—— පදශී.

(අ) සෑම ප්‍රසිඞ නාට්‍ය නිරූපණයක් ද,

(ආ) චලන චිත්‍ර මැජික් ලාම්පු හෝ අන්කිසි එබඳු උපකරණයක මාගීයෙන් ප්‍රදශීනය කරනු ලබන චිත්‍ර හෝ ඇස් බැන්දුම් ද,

(ඉ) නැටුම්, විජ්ජා, ඉන්ද්‍ර ජාල, පිනුම්, බොක්සිං තරඟ, සර්කස්, විවිධ ප්‍රසංග හෝ අනිකුත් වේදිකා ප්‍රසංග ද ඇතුළත් වන අතර, ගෙවා හෝ අන් අන්දමකින් මහජනයාට ඇතුළ් විය නොහැකි පුද්ගලික ස්ථානයක පවත්වනු ලබන යම් කිසි ප්‍රදශීනයක් මීට ඇතුළත් නො වන්නේ ය.

3. ප්‍රසිඞ ප්‍රදශීන විධිමත් කිරීම සඳහා ද, විශෙෂයෙන්ම එසේ ප්‍රදානය කරන ලද බලතලවල සාමාන්‍යත්වයට බාධාවක් නො වන පරිද්දෙන් පහත දක්වෙන කාය්‍ය සඳහා ද නියෝග සම්පාදනය කිරීමට ඇමතිවරයාට පිළිවන. ප්‍රසිඞ ප්‍රදශීන විධිමත් කිරීම සඳහා නියෝග සෑදීමට ඇමතිවරයාට ඇති බලය.

(අ) ප්‍රසිඞ ප්‍රදශීන සඳහා ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සෑදීම පිණිස හෝ යම්කිසි විශෙෂ පොදු ප්‍රදශීනයක් සඳහා හෝ බල පත්‍ර නිකුත් කිරීම හා එවැනි බලපත්‍ර ආපසු ගැනීම තහ නම් කිරීම හෝ ඒවායේ ඇතුළත් කොන්දේසි වෙනස් කිරීම,

(ආ) එවැනි බලපත්‍ර සඳහා ගාස්තු ගෙවීම,

(ඉ) ප්‍රසිඞ ප්‍රදශීනවල අන්දම විධිමත් කිරීම,

(ඊ) ඉදිරිපත් කිරීමට යෝජනා කර තිබෙන යම්කිසි ප්‍රසිඞ ප්‍රදශීනයක විස්තරයක් නියමිත බලධරයා වෙත ඉදිරිපත් කිරීම හා එම බලධරයා එසේ නියම කිරීමට සුදුසු යයි කල්පනා කළ හොත්, එකී ප්‍රදශීනය ප්‍රසිඞ කිරීමට හෝ ඉදිරිපත් කිරීමට හෝ ප්‍රථම එකී බලධරයා ඉදිරියේ එය ඉදිරිපත් කිරීම,

(උ) එබඳු ප්‍රදශීන ඉදිරිපත් කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම හා එබඳු අවසර පත්‍ර ආපසු ගැනීම, තහනම් කිරීම හා ඒවායේ ඇතුළත් කොන්දේසි වෙනස් කිරීම,

(ඌ) බලපත්‍ර නිකුත් කරනු ලැබූ ගොඩනැගිලිවල හෝ ඉදිකිරීම්වල ගොඩනැගිලි තත්වය විධිමත් කිරීම හා ගින්නෙන්, තද බදයෙන්, අවුල්වලින් හෝ අනිකුත් අන්තරාවලින් මහා ජනයා ආරක්ෂා කිරීම,

(එ) බලපත්‍ර නිකුත් කරනු ලැබූ ගොඩනැගිලි හා ඉදිකිරීම් හා ඒවායේ පවත්වන ප්‍රදර්ශන පරීක්ෂා කිරීම,

(ඒ) බලපත්‍ර නිකුත් කරනු නො ලැබූ ගොඩනැගිලි හා ඉදිකිරීම්වල පවත්වනු ලබන ප්‍රදර්ශන හෝ බලපත්‍ර ලත් ගොඩනැගිලිවල හෝ ඉදිකිරීම්වල පවත්වනු ලබන බලය නො ලැබූ ප්‍රදර්ශන හෝ තහනම් කිරීම හා වැළැක්වීම ද වේ.

(2) ඉහත සඳහන් පරිදි සම්පාදිත සියලුම නියෝග හැකි පමණ ඉක්මණින් උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියේ තැබිය යුතු ය. එසේ එකී නියෝග එකී මන්ත්‍රී මණ්ඩල ඉදිරියේ තැබීමෙන් පසු දින හතළිහක් ඇතුළතදී ඉන් ය... කිසි නියෝගයක් අවලංගු කළ යුතු යයි එකී මන්ත්‍රී මණ්ඩල දෙකි... එකක් විසින් සම්මත කර ගනු ලැබුව හොත්, එකී නියෝගය එවක් පටන් නිෂ්ප්‍රභ වන නමුදු ඒ යටතේ කරන ලද කිසිවකට බාධාවක් නො වන්නේ ය.

ආඥා පනතට විරුඬව කරන ලද වැරදිවලට දඬුවම්.

4. (1) මෙම ආඥා පනත යටතේ සම්පාදිත යම්කිසි නියෝගයක් කඩ කරන්නා වූ යම් තැනැත්තෙක් වරදකට වරදකාරයා වන අතර රුපියල් එක්දහකට වැඩි නොවන දඩයකටද වැඩ නොමැතිව මාස හයක කාලයක් බන්ධනාගාර ගත කිරීමේ දඬුවමකට ද යටත් වන්නේය.

(2) එබඳු වරදක් පිළිබඳ නඩුවක් විසඳන මහෙස්ත්‍රාත් කෙනෙකුට එම මහෙස්ත්‍රාත් තැනගේ සාමාන්‍ය අධිකරණ බලය කෙසේ සීමා වී තිබුණත් එම නඩුව විසඳිය හැකි ය.

3 වෙනි හා 4 වෙනි වගන්ති මහා නගර ප්‍රදෙශවල අදාළ නො විය යුතු බව.

5. මහා නගර සභා ආඥා පනතේ * 110 වැනි වගන්තියේ 15 වැනි ඡේදයෙන් මහා නගර සභාවලට දී තිබෙන බලතල යටතේ ප්‍රසිඬ ප්‍රදර්ශන විධිමත් කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කොට තිබෙන හෝ මතුවට සම්පාදනය කර ගත හැකි හෝ මහා නගර ප්‍ර... ශයක් සම්බන්ධයෙන් මෙම ආඥා පනතේ 3 වැනි හා 4 වැනි වගන්ති... අදාළ නො වන්නේ ය. නමුත් එකී ඡේදයෙන් මහා නගර සභාවලට දෙන ලද අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලතලවලට මෙම ආඥා පනතින් ඇමතිවරයා වෙත පවරන ලද සියලු බලතල ද ඇතුළත් ලෙස සැලකිය යුතු ය. එසේම, එකී ඡේදය යටතේ සම්පාදිත අතුරු ව්‍යවස්ථාවකට විරුද්ධව යමෙකු විසින් කරන ලද වරදකදී එම අතුරු ව්‍යවස්ථාව මෙම ආඥා පනතේ නියෝගයක් වූවාක් පරිද්දෙන් එම තැනැත්තා ඊට යටත් වන අතර ඔහු මහා නගර සභා මහෙස්ත්‍රාත් කෙනෙකුගේ සාමාන්‍ය බලතලවල කවර සීමාවක් ඇති වුවද, මහ නගර සභා මහෙස්ත්‍රාත් කෙනෙකු ඉදිරියට ගෙනෙනු ලැබ, එම නඩුව එහිදී විමසිය හැකි වන්නේ ය.

---

* මේ වෙනුවට අලුත් මහ නගර සභා පනතේ 1947 අංක 29, 272 වැනි වගන්තියේ 18 වැනි ඡේදය බලනු.

ප්‍රදර්ශිත මහා ජනයා ඉදිරියේ ඉදිරිපත් කිරීමට සුදුසුබවට සහතික කිරීම.

6. (1) (9) වැනි උප වගන්තියේ විධිවිධානවලට යටත්ව යම් ප්‍රසිද්ධ ප්‍රදර්ශනයක් මහා ජනයා ඉදිරියේ පෙන්වීමට සුදුසු බවට සහතික කරන බලධරයා විසින් එය සහතික කරනු ලැබුව හොත් විනා එසේම එම සහතිකය අවලංගු නො කොට තිබෙන තෙක් විනා එය නො පෙන්විය යුතු ය. නැතහොත් ඉදිරිපත් නො කළ යුතු ය.

(2) ගැසට් පත්‍රයේ ආඥාවක් පළ කරමින් මෙම වගන්තියේ කාර්‍ය්‍ය සඳහා සම්පූර්ණ ලංකාවම සඳහා හෝ ලංකාවේ නියමිත ප්‍රදේශයක් සඳහා හෝ සිය නාමයෙන් හෝ ධුරයේ නාමයෙන් සහතික කිරීමේ බලධරයා පත් කිරීමට ඇමතිවරයාට පිළිවන. තවද මෙම වගන්තිය යටතේ බලතල හා කටයුතු පාවිච්චි කිරීමේදී ඒ පිළිබඳව ඇමතිවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි නියම අනුව සහතික කිරීමේ බලධරයා ක්‍රියා කළ යුතු ය.

(3) සහතික කිරීමේ බලධාරයාට පහත සඳහන් පරිදි ක්‍රියා කිරීමට අභිමතය ඇත්තේ ය. එනම්—

(අ) යෝජනා කර තිබෙන ප්‍රසිද්ධ ප්‍රදර්ශනයක් මහා ජනයා ඉදිරියේ පෙන්වීමට සුදුසු බව දක්වෙන සහතිකයක් ප්‍රදානය කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම, හා

(ආ) (අ) ඡේදය යටතේ කලින් ප්‍රදානය කරන ලද සහතිකයක් ආඥාවකින් අවලංගු කිරීම ද වේ.

එබඳු අවලංගු කිරීමේ සෑම ආඥාවක් ම, සහතිකය ලබා ගැන්ම සඳහා ඉල්ලුම් කළ තැනැත්තා වෙත නියමිත පරිදි භාර කළ යුතුය. එසේ භාර කරනු ලැබූ දිනදී එය වලංගු වන්නේ ය.

(4) (3) වැනි උප වගන්තිය යටතේ යම්කිසි ප්‍රසිද්ධ ප්‍රදර්ශනයක් සම්බන්ධයෙන් සහතිකයක් ප්‍රදානය කිරීම සහතික කිරීමේ බලධරයා විසින් ප්‍රතික්ෂෙප කිරීමේදී හෝ එබඳු සහතිකයක් අවලංගු කරමින් ආඥාවක් කිරීමේදී හෝ එසේ ප්‍රතික්ෂෙප කිරීම හෝ අවලංගු කිරීම සම්බන්ධයෙන් අතෘප්ත වූවකුට එකී ප්‍රතික්ෂෙප කිරීමට හෝ අවලංගු කිරීමට විරුද්ධව නියමිත පරිදි ඇමතිවරයා වෙත ඇපැල් ගත හැකි ය. එබඳු ඇපෑලක් සම්බන්ධයෙන් ඇමතිවරයාගේ තීරණය අවසානවූත්, තීරණාත්මකවූත්, තීරණයක් වන්නේ ය.

(5) මෙම වගන්තියෙන් පවරන ලද හෝ නියම කරන ලද බලතල [illegible] කාර්‍ය්‍ය පාවිච්චි කිරීම සඳහා යෝජනා කර තිබෙන යම්කිසි ප්‍රසිද්ධ ප්‍රදර්ශනයක් එකී බලධරයා හෝ ඇමතිවරයා ඉදිරියේ ද නැතහොත් අන්කිසි නියම කරනු ලබන තැනැත්තන් ඉදිරියේ ද පෙන්වන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට එකී බලධරයාට හෝ ඇමතිවරයාට පිළිවන.

(6) මෙම වගන්තියේ ඉහත සඳහන් විධිවිධාන යටතේ යම් චිත්‍ර පටියක් මහා ජනයා ඉදිරියේ පෙන්වීම සුදුසු බවට සහතික කරනු ලැබූ කල්හි, එසේ සහතික කරන බලධරයාට නියමිත පරිදි එම චිත්‍ර පටිය ලකුණු කරවිය හැකි ය. එසේ ලකුණු කරනු ලැබූ කිසි චිත්‍රපටියක් එසේ ලකුණු කිරීමෙන් පසු යම් වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක් සහිතව නො පෙන්විය යුතු ය. එසේම ඉදිරිපත් නො කළ යුතු ය.